**බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 18 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 15 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුනි 17 දිනද, සභාපතිවරයාට යවා ඇත.

### 1.2. තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයට අදාල මුද්දර ගාස්තු ආදායම රු.14,845,437 ක් වුවද,එය රු.15,228,052 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | ඉදිරියේදි නිවැරදි කර ගනිමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයට අදාලව අයවිය යුතු උසාවි දඩ මුදල රු.3,584,225 ක් වුවද,එය රු.3,624,237 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | ඉදිරියේදි නිවැරදි කර ගනිමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.1,717,276 ක් වුවද,එය රු.2,235,097 ක් ලෙසට ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | ඉදිරියේදි නිවැරදි කර ගනිමි. |
| (iv) | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ පොලී ආදායම රු.379,074 ක් වුවද,එය රු.451,465 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | ඉදිරියේදි නිවැරදි කර ගනිමි. |

| | | | |
|---|---|---|---|
| (v) | ස්ථාවර වත්කම් යටතට ගැනෙන රු.1,235,216 ක් වටිනා භාණ්ඩ වර්ග 16 කට අයත් භාණ්ඩ ඒකක 86 ක් ජංගම වත්කම්වල තොග යටතේ දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කර ගනිමි. |
| (vi) | සමාලෝචිත වර්ෂය තුල කර්මාන්ත සඳහා ගෙවා තිබුණු රු.500,000 ක අත්තිකාරම් අදාල කාර්යය නිමකර තිබියදී, ප්‍රාග්ධන වියදම් යටතේ ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් ප්‍රාග්ධන වියදම් රු.500,000 ක් අඩුවෙන් දැක්වේ. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කර ගනිමි. |

**(ආ)** **<u>විගණනය සඳහා සාක්ෂි නොවීම.</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.8,754,170 ක ඉඩම් හා ගොඩනැගලි ශේෂය සත්‍යාපනය සඳහා ඔප්පු, පිඹුරුපත්, පැවරුම් නියෝග සහ විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | සභාව සතු සියළු ඉඩම් හා ගොඩනැඟිලි නිසි ක්‍රමවේදයක් තුල පවරා ගැනීමක් සිදු නොවීම හා වාර්ෂික තක්සේරු ක්‍රියාවලියේ ඇති ප්‍රමාදයන් හේතුවෙන් නිවැරදි තක්සේරු වටිනාකම් ලේඛන වල ඇතුලත් කිරීමට නොහැකිවී ඇති බව හා අදාල අංශ මේ සම්බන්ධව දක්වන ප්‍රතිචාරය මත අදාල ගැටළුව නිරාකරණය කළ හැකිය. |

**1.4** **<u>අනුකූල නොවීම</u>**
**<u>නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම</u>**

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි</u> | | | |
| (i) මුදල් රෙගුලාසි 396 | මාස 06 ක් ඉක්මවා බැංකුවට ඉදිරිපත් නොකල රු.35,470 ක් වටිනා චෙක්පත් 11 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 571(3) | තැන්පත් කල දින සිට වසර 02 ක් ඉක්මවූ රු.3,321,527 ක පොදු තැන්පතු 23 ක් නිරවුල් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අදහස් දක්වා අනුව කටයුතු කළ නොමැත. යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.12,746,035 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.13,342,374 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂයකට අධික කාලයක සිට බැංකු සැසඳුම් ප්‍රකාශන වල දක්වා තිබුණු උපලබ්ධි නොවූ මුදල් පොතට ගැලපීම් රු.59,635 ක් හා බැංකු ගාස්තු රු.47,430 ක් හඳුනාගෙන අදාල ගැලපීම් කර නොතිබුණු අතර,ඒ පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරිණි. | බැංකු සැසඳුම් වල දැක්වෙන ගැලපීම් කළයුතු විෂයයන් අදාල ගිණුම් වලට ගැලපිය යුතු අතර, බැංකු ගිණුම් වල ශේෂ සනාථ කෙරෙන තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i. | වරිපනම් හා බදු | 282,000 | 538,830 | 535,981 | 2,849 | 274,000 | 274,000 | 458,492 | 860,060 |
| ii. | බලපත්‍ර ගාස්තු | 450,000 | 450,000 | 430,150 | 19,850 | 500,000 | 500,000 | 449,650 | 50,350 |
| iii. | වෙනත් | 15,230,000 | 14,973,170 | 7,708,540 | 7,264,630 | 6,400,000 | 6,400,000 | 17,589,104 | 4,255,271 |
| | එකතුව | 15,962,000 | 15,962,000 | 8,674,671 | 7,287,329 | 7,174,000 | 7,174,000 | 18,497,246 | 5,165,681 |

**2.3.2** <u>ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වසර 02 කට අධික කාලයක සිට පැවත එන හිඟහිටි ආදායම් රු.37,684,507 ක් අය කරගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

**2.3.3** <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති හිඟ උසාවි දඩ රු.2,836,128 ක් සහ හිඟ මුද්දර ගාස්තු 25,119,722 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ උසාවි දඩ සහ හිඟ මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | සියළුම උපලේඛන පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත යොමු කලද මුදල් නිදහස් කිරීමේ පසුගාමීත්වයක් පවති. |

**3.** <u>මෙහෙයුම් සමාලෝචනය</u>

**3.1** <u>කාර්ය සාධනය</u>

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුඛ විහරණය,පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන්,ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ)** <u>අතුරු ව්‍යවස්ථා</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශිය සභා පනතේ වගන්තිය යටතේ 126 ධාන කාරණාප්‍ර 30ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබුණද ,සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් දින වනවිට අතුරු 31 07 වස්ථාවා ක් පනවා හෝ වැළඳගෙන නොතිබුණි . | අතුරු ව්‍යවස්ථා පනවා හෝ වැළඳගෙන නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පනවා ගත යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

**(ආ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව එක්සත් ජාතීන්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව දැනුවත්වී තිබුණද,සභාවට අදාළ කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

## 3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වසර 02 කට අධික කාලයක සිට පැවත එන රු.9,517,239 ක ණය හිමි ශේෂ නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

## 3.3 <u>මානව සම්පත් කළමනාකරණය</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් දිනට 31 03 සභාවේ තනතුරු කට අදාළ පුරප්පාඩු 03 ක් පැවතුනි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුවේ. | අදාල පුරප්පාඩු සම්පූර්ණ කිරිමට කටයුතු කර නොමැති වුවද කළමනාකරණ සහකාර හා කාර්යාල කාර්ය සහායක තනතුරුවල රාජකාරි ආවරණය සඳහා වෙනත් නිලධාරින් හට පවරා ඇත. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv වන පරිච්ඡේදයේ 1.6 හා 4 වගන්ති අනුව ස්ථානමාරුවී ගිය,විශ්‍රාම ගිය හා සේවය අතහැර ගිය නිලධාරින් පස් දෙනෙකුගෙන් අයවිය යුතු රු.503,857 ක සේවක ණය මුදල් අය කරගෙන නොතිබුණි. | අයවිය යුතු හිඟ ණය ශේෂ අය කරගත යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 01 ක් පමණක් පවත්වා තිබුණි. | කාර්තුවකට එක් වරක් වන පරිදි විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුවේ. | අභ්‍යන්තර විගණන ඒකකය සමඟ සාකච්ඡා කර කාර්තුවකට එක බැගින් විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීමට කටයුතු කිරීමේ හැකියාව කෙරෙහි යොමුවන බව. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |